# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**2025 ලෝක ජනාවාස දින පාසල් චිත්‍ර / රචනා තරගය**

2025 ඔක්තෝබර් මස 06 වෙනි දිනට යෙදී ඇති ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පැවැත්වෙන චිත්‍ර හා රචනා තරග සඳහා දිවයිනේ සියලුම පාසල් ශිෂ්‍ය / ශිෂ්‍යයාවන්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

**ඔබේ නිර්මාණ සඳහා පදනම් කර ගත හැකි විෂය ක්ෂේත්‍රය**

- "මගෙ ලස්සන පුංචි ගෙදර"

(ආදායමට ඔරොත්තු නොදෙන විසල් නිවාස ඉදිකර ගනිමින්, ජීවිතය තුළ විසඳාගත නොහැකි ප්‍රශ්න අතරේ අතරමං වන, හුදකලාවන මිනිස්සුන්ට තමන්ට ගැලපෙන නිවහනක් ඉදිකිරීමේ වැදගත්කම ඉස්මතුවන ලෙස ඔබගේ නිර්මාණය ඉදිරිපත් කරන්න.)

**තරග සහභාගිත්වය ඃ**

රජයේ පාසලක හෝ පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍ය / ශිෂ්‍යයාවන්ට මේ තරග සඳහා සහභාගි විය හැකිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරන නිලධාරින්ගේ දරුවන්ට මෙම තරග සඳහා සහභාගි විය නොහැකි ය.

---

**පාසල් චිත්‍ර තරගය**
**තරග කාණ්ඩ**

| | |
|---|---|
| පළමු කාණ්ඩය | - 03, 04 සහ 05 ශ්‍රේණි |
| දෙවන කාණ්ඩය | - 06, 07, 08 සහ 09 ශ්‍රේණි |
| තෙවන කාණ්ඩය | - 10, 11, 12 සහ 13 ශ්‍රේණි |

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

චිත්‍ර තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ අඟල් 17 x 22 ප්‍රමාණයේ කඩදාසියක නිර්මාණය කළ යුතු වේ.

මෙම චිත්‍රය නිර්මාණය කිරීම සඳහා පැස්ටල්, දියසායම්, පැන්සල් වැනි ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකි ය. **( මෙම කොන්දේසි සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

---

**පාසල් රචනා තරගය**
**තරග කාණ්ඩ**

| | | |
|---|---|---|
| පළමු කාණ්ඩය | - | 06 ශ්‍රේණිය සිට 09 ශ්‍රේණිය දක්වා (වචන 300 ක උපරිමයකට යටත්ව) |
| දෙවන කාණ්ඩය | - | 10 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා (වචන 500 ක උපරිමයකට යටත්ව) |

**නිර්මාණ මාධ්‍ය**

1. සිංහල මාධ්‍ය
2. දෙමළ මාධ්‍ය

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

පළමු කාණ්ඩය - අයදුම්කරුවන් වචන 300ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.
දෙවන කාණ්ඩය - අයදුම්කරුවන් වචන 500ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.

**ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග**

සියලු තරගවල අවසාන ජයග්‍රාහකයින් හට පහත සඳහන් අයුරින් ත්‍යාග පිරිනැමේ.

**ප්‍රථම ස්ථානය**

**රුපියල් 15,000/- ක් , කුසලානයක් සහ සහතික පතක්**

**දෙවන ස්ථානය**

**රුපියල් 10,000/- ක් , කුසලානයක් සහ සහතික පතක්**

**තෙවන ස්ථානය**

**රුපියල් 7,500/- ක් , කුසලානයක් සහ සහතික පතක්**

**කුසලතා ත්‍යාග**

**රුපියල් 3,000/- ක් බැගින් වූ කුසලතා ත්‍යාග 10ක් සහ සහතික පත් 10 ක්**

**ත්‍යාග ප්‍රදානය**

ජයග්‍රාහකයන්ට හිමි ත්‍යාග 2025 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පැවැත්වෙන ජාතික උත්සවයේ දී ප්‍රදානය කෙරේ.

**අයදුම්පත් සමඟ නිර්මාණ ඉදිරිපත් කිරීම**

සියලු අයදුම්කරුවන් ඒ සඳහා නියමිත අයදුම්පත සමඟින් ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණ ඔබගේම නිර්මාණයක් බවට ඔබ ඉගෙනුම ලබන විදුහලේ, විදුහල්පති විසින් සහතික කරවා ගෙන 2025 සැප්තැම්බර් මස 20 වන දිනට ප්‍රථමව තැපෑලෙන්, පෞද්ගලිකව හෝ පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු වේ (නිවාස සංවර්ධන අධිකාරියට අයත් දිස්ත්‍රික් කාර්යාලවලටද ගෙනවිත් භාරදිය හැකිය). අයදුම්පත්‍රය රහිතව ඉදිරිපත් කෙරෙන නිර්මාණ භාර ගනු නොලැබේ. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ලෝක ජනාවාස දිනය 2025 - නිර්මාණ" යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඉහත සඳහන් තරග සඳහා ඉදිරිපත් කරන සියලු නිර්මාණ සඳහා අයදුම්පත් පහත සඳහන් ලිපිනයෙන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වෙතින් හෝ www.nhda.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි වේ.

**ලිපිනය -** **සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක) ,**
**තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය ,**
**07 වන මහල ,**
**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ,**
**චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත ,**
**කොළඹ - 02 .**

**දුරකථන අංක ඃ 011-2447038 / 011-2389513 / 0112-447207**

# 2025 ලෝක ජනාවාස දිනය.

**පාසල් චිත්‍ර / රචනා තරගය සඳහා අයදුම්පත**

**සහභාගි වන තරගය කාණ්ඩය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) ඃ ----------------------------------------------------
-------------------------------------------------------------------------------------------------

2. සහතික පත්‍රයේ සම්පූර්ණ නම සඳහන් විය යුතු ආකාරය (ඉංග්‍රීසියෙන් ) ඃ ------------------------
-------------------------------------------------------------------------------------------------

3. ඉගෙනුම ලබන පාසල හා ශ්‍රේණිය ඃ ----------------------------------------------------------
4. පාසල අයත් දිස්ත්‍රික්කය හා දුරකථන අංකය ඃ ----------------------------------------------------
5. පෞද්ගලික ලිපිනය හා දුරකථන අංකය ඃ -----------------------------------------------------
6. උපන් දිනය ඃ ----------------------------------------------------------------------------------
7. 2025 අගෝස්තු මස 01 දිනට වයස අවුරුදු ඃ ---------------------------------------------------

මෙම අයදුම්පත් සමඟින් ඉදිරිපත් කොට ඇති චිත්‍රය / රචනාව මා විසින් නිර්මාණය කරන ලද චිත්‍රයක්/ රචනාවක් බව මෙයින් සහතික කරන අතර, අදාළ චිත්‍ර / රචනා තරගාවලියේ සියලු තරග කොන්දේසිවලට යටත් ව ඉදිරිපත් කොට ඇති අතර, එකී තරගයේ විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම තීරණයකට මා එකඟ බව මෙයින් දන්වනු කැමැත්තෙමි.

-------------------

අත්සන

දිනය ඃ ------------------------

----------------------------------------------------------- විසින් මෙම අයදුම්පත සමඟින් ඉදිරිපත් කර ඇති චිත්‍රය / රචනාව නිර්මාණය කොට ඇති බවත්, ඉහත අයදුම්පතෙහි ඉදිරිපත් කොට ඇති සියලු තොරතුරු සත්‍ය බවත්, මෙයින් සහතික කරමි.

---------------------------

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය ඃ -------------------------

සැලකියි යුතුයි - (මෙම අයදුම්පත නිර්මාණවල පසුපිටේ ඇලවීමෙන් නිර්මාණයට හානි සිදුවේ. එබැවින් එවැනි නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට සිදුවන අතර **අයදුම්පත නිර්මාණයට අමුණා එවීමට කටයුතු කරන්න)**